

# කස්තිරම

## බී බී කුරුප්පු

**සුබ සහ යස නාටකයේ නවතම ජවනිකාව සකස් වන්නේ ද ඒ වාගේම පසුබිමකය. සරත් ෆොන්සේකා විය යුතු ආකාරයට නිසි කලට විශ්‍රාම ගියේ නම් ඔහු අද අප වාගේ සාමාන්‍ය පුරවැසියෙකි. කාටත් අමතකව යන්නටත් ඉඩ තිබුණේ ය. කොටි පරද්දන්නට සිහිනෙන්වත් සිතන්නට ඔහුට ඉඩක් නොලැබෙන්නට තිබිණි.**



# සුබ යස සහ සිරිසඟබෝ

සනාතන සුබ සහ යස හබයේ නවතම ජවනිකාව රඟදැක්වෙන මොහොතක ලියන මේ ලිපිය පළ වන විට නළුවන් කරළියෙන් බැහැරව සිටිනු ඇත. එක්කෝ සුබ නැත්නම් යස කරළිය මත තවමත් ප්‍රෙක්ෂකයන්ට ආචාර කරමින් රැඳී සිටිනවාත් විය හැකිය.

සුබ යස අරගලයේ මුල දන්නා කෙනෙක් නැත. නිමාවක්ද නැත. සුබ පෙරමුණට එන්නේ යස නිසා ය. යසගේ අනුග්‍රහයෙනිඃ විටක යස ගේ නුණුවනකම නිසා ය. අපේ රජ පරපුරේ යස ගේ එබඳු මෝඩකමක් නිසා ඔහුගේ හිස ගසා දමන්නටත් සුබ සමත් විය.

නමසිය හැත්තෑගණන් වල ඕස්ට්‍රේලියාවේ අගමැතිව සිටි ගෆ් විට්ලම් ද ඔය වාගේ මෝඩකමක් කළේ ය. බොබ් හෝක් බඳු කම්කරු නායකයන් එපා කියද්දී ජෝන් කර් නමැත්තා අග්‍රාණ්ඩුකාර තනතුරට ඔසොවා තැබුවේ ය. ඒ සුබ අවතාරය ඔහුට හතුරුකම් කරන්නට වැඩි කලක් ගතවූයේ නැත. යම්තම් පොටක් පෑදුණු විගසින් අගමැති ගෙදර යවමින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ ය.

පාකිස්ථානයේ අගමැති අලි භූතෝ සිය හමුදාපති ධුරයට සියා උල් හක් පත් කළේ කිසිවකුගේ රෙකමදාරුව මත වන්නටත් ඇත . මොකක්දෝ කෝන්තරයක් සිතේ තියාගෙන හිටපු සියා උල් හක් භූතෝ පහ කොට බලය අල්ලා ගත්තේ ය. එතැනින් නොනැවතී ඔහු එල්ලා මරන්නටත් සිතුවේ ය. අන්තිමට එල්ලා මරන ලද්දේ පණ නැති භූතෝ සිරුර බව කියනු ලැබේ.

සුබ සහ යස නාටකයේ නවතම ජවනිකාව සකස් වන්නේ ද ඒ වාගේම පසුබිමක ය. සරත් ෆොන්සේකා විය යුතු ආකාරයට නිසි කලට විශ්‍රාම ගියේ නම් ඔහු අද අප වාගේ සාමාන්‍ය පුරවැසියෙකි. කාටත් අමතකව යන්නටත් ඉඩ තිබුණේ ය. කොටි පරද්දන්නට සිහිනෙන්වත් සිතන්නට ඔහුට ඉඩක් නොලැබෙන්නට තිබිණි. මොකක්දෝ පිනකට නැත්නම් ජනාධිපති ගේ මෝඩකමට ඔහුගේ සේවය දීර්ඝ කොට සටන මෙහෙයවීමේ අවසරය ලබා දෙන්නට මහින්ද රාජපක්ෂ තීරණය කළේ ය. කාගේ කාගේ ත් වීර ක්‍රියා හේතු කොට ගෙන සිතුවාටත් කලින් සටන හමාර කළ හැකි විය.

දැන් සුබ ගේ වාරය ඇවිල්ලා ය. ඔහුට පරණ සුබට තිබුණු බලතල නැත. තිබුණා නම් රාජපක්ෂ ගේ හිස ගසා දැමීමට අණ කිරීමටත් ඉඩ තිබුණේ ය. රජ්ජුරුවන් සිංහාසනයෙන් ඉවත් කළ යුතුව ඇත. කාගේ හෝ පිහිට ලබාගෙන ඒ හරිය කරන්නටය දැන් සරත් ෆොන්සේකා ක්‍රියා කරන්නේ. එහෙම වෙලාවට රජුට එරෙහිව උදව්වට එන්නෝ අනන්ත ය. එක එකා ඇන කොටා ගනිමින් සිටි උදවිය දැන් සරත් වටා රොක් වී ඔහු ඉදිරියට අරන් යන්නෝ ය.

පරණ හාදකම් අමතක කොට පරණ තරහකාරයන් ළං කර ගන්නේ ඒ විදියේ සටනක් තියෙනකොට ය. තමන්ට බැනපු උදවිය හරි තමන්ගේ සුදුසුකම් සමච්චලයට ලක් කළ උදවිය වුනත් කමක් නැත. දැන් ඒ සියල්ලෝම සරත් ෆොන්සේකා ගේ ජයග්‍රහණය උදෙසා කඳවුරු ලා ගෙන සටන් කරති.

ඒ කාට කාටත් යසගෙන් පලි ගන්නට වුවමනා ය. එය කළ හැකි එකම පිළිවෙල සුබ ඔසොවා තැබීම ය. සුබ සහ යස බල අරගලය එක්කම දැන් ජය පරාජය ගැන කියන අනාවැකිත් ජයග්‍රහණයෙන් පසු කරන සංශෝධන හා ප්‍රතිශෝධනත් අනන්තය - දැන් හැමදෙනාම එකිනෙකා පරයමින් පොරොන්දු දෙන්නෝ ය. අනාගත සමෘද්ධිය මවා පාන්නෝ ය.

2009 සැප්තැම්බර් 9 වැනිදාට රනිල් වික්‍රමසිංහට අගමැති පුටුව දෙමින් රත්නසිරි වික්‍රමනායක අගමැති ජනාධිපති ධුරයට පත්වන බව කී දෛවඥ චන්ද්‍රසිරි බණ්ඩාර වාගේම ජනාධිපතිගේ ඉදිරි කාලය අතිශය සුබදායක බව කියන සුමනදාස අබේගුණවර්ධනත් අනාවැකි කීම නවතා නැත .

කොහොම කොහොම හරි දැන් පෙනෙන විදියට නම් සරත් ෆොන්සේකාට වත්මන් සුබ චරිතය අහිමි වන පාට ය. මට පෙනෙන ආකාරයට නම් සටන හමාරවෙනකොට සුබගේ දොරටුපාල ඇඳුම් උනා තබන සරත් ෆොන්සේකා සිරිසඟබෝ චරිතයට ආරූඪ වෙනවා ය.

සිරිසඟබෝ රජ්ජුරුවන් බෝධිසත්වයකු බවට පරිවර්තනය කරන ලද්දේ අපේ හාමුදුරුවන් බවය මට හිතෙන්නේ. කොහොම කිව්වත් සිරිසඟබෝ කියන්නේ රජකම කරගන්නට බැරුව දාලා පලච්ච දුර්වලයකු නිසා ය. අපරාදේ කියන්නට බැරිය - සරත් ෆොන්සේකා නම් ඒ වාගේ දුර්වලයෙක් නොවේ. හරිහමන් සෙබළ නායකයෙකි. සටන් කාමියෙකි. දැන් ඔහුට හමුදාපතිකම නැති එක විතරය.

ප්‍රශ්නය වනුයේ සරත් ෆොන්සේකා ආරූඪ වන සිරිසඟබෝ චරිතය කුමක්ද කියන එක ය. සිරිසඟබෝලා දෙජාතියක් ඇත. එක් ජාතියක් රට වෙනුවෙන් හරි වෙන මොකක්වත් හේතුවකට හරි තමාගේ බලතල වරප්‍රසාද පමණක් නොව ජීවිතය පවා පරිත්‍යාග කරන පුද්ගලයන්ගෙන් සමන්විත ය.

අනෙක් ජාතිය එයින් සපුරා වෙනස්ය. ඔහු සතු බලතල නැත්නම් දිවිය පවා අහිමි වන්නේ ඔහුගේ කැමැත්තට නොවේ. බලෙන් පැහැරගැනීම නිසා ය. එය හොඳ විදියට විස්තර කරන්නේ අපේ නගරයේත් ගම්වලත් ඉන්න ගැටවරයෝ ය. ඔවුන් එයට කියන්නේ සිරිසඟබෝ පෙන්වනවා කියා ය. තවත් දරුණු උදවිය ඊට වඩා ලස්සනට ඔය කතාවම කියනවා ය. උඹේ ඔලුව ගලවලා අතට දෙනවා යයි කීවොත් අන්න ඒ සිරිසඟබෝ පෙන්වීමේ නියම විලාසයයි.

සිරිසඟබෝ රංගනයේ අති විශිෂ්ට ජවනිකාව වන්නේ ද එයයි. හොඳකට ඇත්තේ ඒ ක්‍රියාව වචනාර්ථයෙන් සිදු නොවීම ය. රඟපෑමක් නිසා එය රූපකාර්ථයෙන් සිදුවන්නක් පමණි. අන්තිමට ඉතිරිවන්නේ හිස නැති සිරිසඟබෝ කෙනෙකි. ඒකෙත් තේරුම ඉතිරි වෙච්ච ඔලු ගෙඩිය නිකම් හිස් ගෙඩියක් බවට බරිවර්තනය වෙනවා කියන එකය.

අර කියාපු දෙවිදියෙන් කොයි විදියට හරි සරත් ෆොන්සේකා සිරිසඟබෝ පදවිප්‍රාප්ත වන බව ය. පෙනෙන්නේ. විහින් කර ගත්තත් අනුන් කළත් දෙකෙන්ම සිදුවන්නේ හිස ගහලා යන එක ය.

*එතකොට නම් අර මහින්ද රාජපක්ෂ ජනාධිපති කල්තියාම කියාපු හරිය ඇත්ත වෙන්ටත් ඉඩ තිබේ. අන්තිමේදී තමුන්නාන්සේට ඔය අද වටේ ඉන්න කිසි කෙනෙක් ඉතිරිවෙන්නේ නැතැයි එතුමා හූනා කියන්නා වාගේ කීවේ ය. පල ඇති රුකට වහන කුරුළු කොබෙයියෝ පල නොදරන ගසේ කල් නොමරන්නෝ ය. හොඳ අත්තක් බලා පියාසර කරන්නෝ ය.*

*එතකොට ජනාධිපතිගේ ආරාධනාව පිළිගන්නට සරත් ෆොන්සේකා හිතාවිද? මා ගාවට එන්න. මං ඔබව බලා ගන්නම් කියා ය ඔහු එදා කීවේ. ඒ වචන විශ්වාස කරන්නට ෆොන්සේකා මහතාට පුලුවන් ද? නැත්නම් හරිත කාඩ් පත අරන් ඒ දිසාවට පියාසර කරන්නට හිතාවිද? තීරණය ඔහුගේමය.*


# AusLanka Study Center™
**Education Agents**

## **Free** Consultation for Sri Lankan Students

- Want to change Education Provider and Course?
- Need Cancellation Letter or Released Letter?
- Have you completed your Diploma and want to do your Degree?
- Don't pay high course fee.

**Talk to leading education agents for**

- Change of education provider
- Uni/Tafe placement
- Any University or Tafe College
- Visa sub class 572 to 573
- Visa sub class 573 to 572
- Extend Student Visa
- New Student Visa
- Sponsor your Relatives for Student Visa

**Call NOW!**

Mobile: **0433 023 687**
Skype : **auslanka-center**
**www.auslanka.edu.lk** *(Call, SMS or email)*
**eranl@auslanka.edu.lk**

ABN 50758298781
Scholarships are available for limited Numbers of Students *
*Condition apply

**Colombo • Galle • Kandy • Matara • Melbourne**